# අ.පො.ස උසස් පෙළ



# ව්‍යාපාර අධ්‍යයනය



## 7.2: ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහය වන මූල්‍ය ආයතන පද්ධතිය අධ්‍යයනය කරයි.

## 7.3 නිපුනතා මට්ටම :

# ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහය වන මූල්‍ය ආයතන පද්ධතිය අධ්‍යයනය කරයි.

### ඉගෙනුම් ඵල :

- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය වර්ග කරයි.
- දෙන ලද මූල්‍ය ආයතන සමූහයක් එක් එක් වර්ගය යටතේ වෙන් කර දක්වයි.
- එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන නිදසුන් සහිතව පැහැදිලි කරයි.
- එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වයට දායකවන ආකාරය පෙන්වා දෙයි.

**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය පහත දැක්වෙන ආකාරයට වර්ග කල හැකියි.

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය.
  - බැංකු අංශය
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිතබැංකු
  - තැන්පතු බාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
    - බලපත්‍රලාභී මුදල් සමාගම්
    - සමූපකාර ග්‍රාමීය බැංකු
    - සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති
  - විශේෂිත මූල්‍ය ආයතන
    - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
    - ප්‍රාථමික අලෙවිකරුවන්
    - කොටස් තැරැව්කරුවන්
    - ඒකකභාර / ඒකකභාර කළමනාකරණ සමාගම්
    - වෙළඳපොළ අතරමැදියන්
    - ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම
  - ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන
    - රක්ෂණ සමාගම්
    - සේවක අර්ථසාධක අරමුදල
    - සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
    - අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල්
    - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## ව්‍යාපාර වල ක්‍රියා ක්‍රියාකාරී ක්‍රියාකාරිත්වයට මූල්‍ය ආයතන දායක වන ආකාරය

බැංකු අංශය

### 1. ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka)




- ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියාකරන කේන්ද්‍රය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවයි.
- මෙම ආයතනය 1949 අංක 58 දරණ මූල්‍ය පනත යටතේ ආරම්භ කරන ලද්දේ 1950 අගෝස්තු 28 දිනයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිපාලනය හා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන්නේ "මුදල් මණ්ඩලය" මඟිනි.


Copyright © e-thaksalawa.moe.gov.lk

## 2. බලපත්‍රලාභී වාණිජ බැංකු (Licensed Commercial Bank)

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන බලපත්‍රයක් යටතේ ජංගම ගිණුම් හෙවත් ඉල්ලුම් තැන්පතු පවත්වාගෙන යාමට හා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යාමට අවසර ඇති මූල්‍ය ආයතන විශේෂය මෙනමින් හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇත. (උදාහරණ කිහිපයක් සහිත ව)




**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 3. බලපත්‍රලාභී විශේෂිත බැංකු (Licensed Specialized Banks)

ජංගම ගිණුම් හෙවත් ඉල්ලුම් තැන්පතු පවත්වා පවත්වාගෙන යාමට සහ විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමට අවසර නොමැති, විදේශ බැංකු කටයුතු පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍ර ලබාගෙන ඇති බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු ලෙස හැඳින්වේ.

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිදසුන් කිහිපයක්:

- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- ඩී.එෆ්.සී.සී. බැංකුව

**බලපත්‍රලාභී විශේෂිත බැංකු, ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට දායක වන ආකාරය.**

- කාලීන හා ඉතිරිකිරීමේ තැන්පත් භාරගැනීම.
- විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම.
- සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු.
- කල්බදු පහසුකම් සැපයීම.
- කළමනාකරණ උපදේශන සේවා සැපයීම.

**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 3. බලපත්‍රලාභී මුදල් සමාගම් (Finance Companies)

කාලීන තැන්පතු භාරගැනීම, එම මුදල් මත ණයදීම සහ ආයෝජනය සඳහා, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති පොදු සමාගම් විශේෂයක් ලෙස මෙම සමාගම් හැඳින්විය හැකියි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම් රාශියක් ඇත.

<u>මූල්‍ය සමාගම් සඳහා නිදසුන් කිහිපයක්:-</u>

- එල් බී ෆිනෑන්ස් පී.එල්.සී
- සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී
- ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී
- සිංගර් ෆිනෑන්ස් පී.එල්.සී
- ආපිකෝ ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්

### බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යයන්.

- ➢ කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම.
- ➢ දේපල හා ඉඩම් වෙළඳාම.
- ➢ කල්බදු මූල්‍යකරණය.
- ➢ කෙටිකාලීන ණය සැපයීම.
- ➢ රජයේ සුරැකුම්පත් වල ආයෝජනය.
- ➢ කාලීන තැන්පතු භාරගැනීම.









The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## සමුපකාර ග්‍රාමීය බැංකු - (Co-operative Rural Banks)

විවිධ සේවා සමූපාකාර සමිතිවල බැංකු ව්‍යාපාරික අංශය වන මෙම ආයතන, සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් කාලීන හා ස්ථාවර තැන්පත් ලබාගැනීම සහ සිය සාමාජිකයින්ට ණය සැපයීම ප්‍රධාන කර්තව්‍යය ලෙස සිදු කරයි. ජංගම ගිණුම් පවත්වාගෙන යාමට මේවාට අවසර නැත.

**උදා** - මරදගහමුල විවිධ සේවා සමූපාකාර සමිතියේ - ග්‍රාමීය බැංකුව
රත්නපුර විවිධ සේවා සමූපාකාර සමිතියේ - ග්‍රාමීය බැංකුව




**<u>සමූපාකාර ග්‍රාමීය බැංකුවල කාර්යයන්.</u>**

1. සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් තැන්පත් භාර ගැනීම.
2. සාමාජිකයින්ට කෘෂිකර්මය, නිෂ්පාදනය, කර්මාන්ත හා අලෙවි කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම.
3. උකස් කටයුතු කිරීම.
4. ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වාගෙන යාම.
5. සමූපකාර ජීවන ක්‍රමය ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම.


Copyright © e-thaksalawa.moe.gov.lk

## සකසුරුවම් හා ණය ගණුදෙනු සමූපාකාර සමිතිය (සණස)

සාමාජිකයින්ගෙන් ඉතුරුම්, සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සමාජිකයින්ට පමණක් ණය සැපයීම සිදු කරන, සමූපාකාර පනත යටතේ ලියාපදිංචි කර පිහිටුවනු ලබන ආයතන විශේෂය "සණස" සමිති හෙවත් සකසුරුවම් හා ණය ගණුදෙනු සමූපාකාර සමිතිය ලෙස හදුන්වයි.

**නිදසුන්** - මිරිස්වත්ත සණස සමිතිය.
හබරාදුව සණස සමිතිය.

**<u>සණස සමිතිවල කාර්ය භාරය :-</u>**

- තැන්පත් භාර ගැනීම හා සාමාජිකයින්ට ණය දීම.
- සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- සමිතියේ සාමාජිකයින් නියැලී සිටින ආර්ථික කටයුත්තකට අයත් උපකරණ සහන මිලට අලෙවි කිරීම.

  උදාහරණ - ගොවි සමූපාකාර සමිති - ගොවි උපකරණ අලෙවි කිරීම.
  ධීවර සමූපාකාර සමිති - ධීවර ආම්පන්න අලෙවි කිරීම.





Copyright © e-thaksalawa.moe.gov.lk

## විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්. (Special Leasing Companies)

- වත්කමක් බද්ධට මිලදී ගැනීමකදී, ඊට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම **ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත කරගත්** මූල්‍ය ආයතන විශේෂය කල්බදු සමාගම් ලෙස හැඳින්වේ. මෙම සමාගම් කල්බදුකරණය සඳහාම මහ බැංකුවේ ලියාපදිංචි වේ.
- වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම්, මෙම සමාගම්වල ප්‍රධාන ආදායම වේ.

නිදසුන් -

- සීමාසහිත ඔරික්ස් ලීසිං සමාගම.
- සීමාසහිත ඇසෙට්ලයින් ලීසිං සමාගම.
- සීමාසහිත එස්.එම්.බී. ලීසිං සමාගම.
- සීමාසහිත කොමර්ෂල් ලීසිං සමාගම.
- සීමාසහිත සෙලාන් මර්චන්ට් ලීසිං.
- සීමාසහිත සෙරු ලීසිං සමාගම.

### ව්‍යාපාරිකයින්ට කල්බදු සමාගම් මඟින් ඉටු වන සේවය.

- විශාල වටිනාකමකින් යුතු වත්කම්, මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම.
- කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම.
- වත්කම් යල් පැනීම නිසා සිදු වන පාඩු හා ප්‍රාග්ධන අලාභ මඟ හැරීම.
- විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයීමට හැකි වීම.




Copyright © e-thaksalawa.moe.gov.lk

## ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers)

රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ. එසේ සුරැකුම්පත් ප්‍රථම වතාවට මිලදී ගැනීම සිදුවන වෙළෙඳපොල ප්‍රාථමික වෙළෙඳපොල ලෙස හැඳින්වේ.

- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාථමික වෙළෙඳපොලට සහභාගී වීම, සහ
- එසේ ප්‍රාථමික වෙළෙඳපොලෙන් මිලදී ගත් සුරැකුම්පත් නැවත ආයෝජකයින් අතර ගනුදෙනු කිරීම, (ද්විතීයික වෙළෙඳපොල) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික කාර්ය භාරය වේ.

නිදසුන් -

- කැපිටල් එලායන්ස් සමාගම.
- සෙලින්කෝ ශ්‍රී රාම් සුරැකුම්පත් සමාගම.
- ලංකා බැංකුව.
- සම්පත් සුරැකුම්පත් සමාගම.

## කොටස් තැරැව්කාර සමාගම්. (Share Brokers)

සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම සහ මිලට ගැනීම පිළිබඳ ගනුදෙනුවලදී අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන කොටස් තැරැව්කාර සමාගම් ලෙස හැඳින්වේ.

එම කොටස් තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා, එම ආයතන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.


Copyright © e-thaksalawa.moe.gov.lk

නිදසුන් -

- සීමාසහිත ආශා ෆිලිප් සුරැකුම්පත් සමාගම.
- සීමාසහිත ඒෂියා සුරැකුම්පත් (පුද්ගලික) සමාගම.
- සීමාසහිත සෙලින්කෝ කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම.
- සීමාසහිත H.N.B කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම.

**කොටස් තැරැව්කාර සමාගම්වල කාර්යයන්.**

1. ආයෝජකයින්ගේ ගැනුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම.
2. ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම.
3. ආයෝජකයින්ට උපදෙස් සැපයීම.
4. ආයෝජකයින්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම සඳහා කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම හා වෙළෙඳපොළ සමීක්ෂණ වාර්තා සැකසීම.
5. සමාගම් ලැයිස්තු ගත කිරීමට අනුග්‍රහය දැක්වීම.
6. සීමාසහිත පොදු සමාගම්වල ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහාය වීම.

## ඒකකභාර / ඒකකභාර කළමනාකරණ සමාගම්.

**(Unit Trust / Unit Trust Management Companies)**

**ඒකකභාර:-**

ඒකකභාර යනු, ඒකකවලින් සමන්විත වූ ආයෝජන අරමුදලකි. ආයෝජකයින්ට ඒකක විකිණීමෙන් එම අරමුදල රැස්කර ගනියි.



Copyright © e-thaksalawa.moe.gov.lk

**<u>ඒකකභාර කළමනාකරණ සමාගම:-</u>**

ඒකකභාරයේ රැස් වූ මුදල්, කුමන ආයෝජන මාර්ගවල ආයෝජනය කළ යුතුද යන්න තීරණය කරමින්, එම අරමුදල කළමනාකරණය කරනු ලබන සමාගම, "අරමුදල් කළමනාකරණ සමාගම" යනුවෙන් හැඳින්වේ.

ඒ අනුව ඒකක භාරයකට සම්බන්ධ පාර්ශව තුනක් ඇති වේ.

1. ඒකක භාරකරු.
2. අරමුදල් කළමනාකරණ සමාගම.
3. ඒකක හිමියන් හෙවත් ආයෝජකයින්.





The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ඒකක භාරකරුවන් සඳහා නිදසුන් කිහිපයක් -

- නාමල් ඒකක භාරය
- සී. බැන්ක් ඒකක භාරය
- සිලෝන් ඉතුරුම් අරමුදල

අරමුදල් කළමනාකරණ සමාගම් නිදසුන් -

- NATIONAL ASSET MANAGEMENT LTD
- CEYLON ASSET MANAGEMENT LTD
- CT FUND MANAGEMENT LTD
- UNIT TRUST MANAGEMENT COMPANY LTD
- EAGLE NDB FUND MANAGEMENT LTD


## ඒකකභාරවල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ :-

1. රු.1000 ක් වැනි මුදලකින් වුවත් ආයෝජනය ඇරඹීමට හැකි වීම.
2. විවිධාංගීකරණය වූ ආයෝජනවල (ආයෝජන කළඹක) මුදල් යෙදවීම නිසා අවදානම අඩුවීම.
3. අයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලැබීම.
4. ඒකකභාර සඳහා ලැබෙන ලාභාංශ ආදායම් බදු වලින් නිදහස් වීම.
5. මිල ඉහළ යන විට අලෙවි කර, ප්‍රාග්ධන ලාභ ලබාගත හැකි වීම.
6. එම ප්‍රාග්ධන ලාභ ද ආදායම් බද්දෙන් නිදහස් වීම.
7. අවශ්‍ය අවස්ථාවකදී, පහසුවෙන් මුදල් කර ගැනීමේ හැකියාව.
8. හදිසි ණය ලබා ගැනීමකදී ඇපයක් ලෙස 'ඒකක භාර සහතිකය' ඉදිරිපත් කිරීමේ හැකියාව.


Copyright © e-thaksalawa.moe.gov.lk

## වෙළෙඳපොළ අතරමැදියන් (Market Intermediaries)

වෙළඳපොළ අතරමැදියන් ලෙස මෙහිදී අදහස් කරන්නේ, මූල්‍ය වෙළඳපොලේ මූල්‍ය උපකරණ වෙළඳාම් කිරීමේ අතරමැදියන් ය.




**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
Copyright © e-thaksalawa.moe.gov.lk

**<u>මූල්‍ය වෙළඳපල අතරමැදියන්.</u>**

- ප්‍රාරක්ෂකයින් ලෙස කටයුතු කරන ආයතන.
- ආයෝජන කළමනාකරුවන් ලෙස කටයුතු කරන ආයතන.
- ආන්තික සැපයුම්කරුවන් ලෙස කටයුතු කරන ආයතන.

**ප්‍රාරක්ෂකයන් (Underwriters)**

සීමාසහිත පොදු සමාගමක් මහජනයාට සිදු කරනු ලබන කොටස් නිකුතුවක දී, නියමිත කාලය තුළ සැලසුම් කළ අරමුදල් ප්‍රමාණය සපයා ගත නොහැකි වූ විට, ආයෝජකයින් විසින් මිලදී නොගෙන ඉතිරි වූ කොටස් , මිලදී ගැනීමට ගිවිස ගන්නා ආයතන ප්‍රාරක්ෂකයන් ලෙස හැඳින්වේ.

කොටස් නිකුත් කරනු ලබන සමාගම, ප්‍රාරක්ෂණ සමාගමට 'ප්‍රාරක්ෂණ කොමිස්' ගෙවනු ලබයි.

<u>ප්‍රාරක්ෂණ කටයුතු සිදු කරන ආයතන;</u>

- ✓ බලපත්‍රලාභී වාණිජ බැංකු
- ✓ බලපත්‍රලාභී විශේෂිත බැංකු
- ✓ වණික් බැංකු

**ආයෝජන කළමනාකරුවන් (Investment Management Companies)**

මහජනයාට සුරැකුම් නිකුතුවක දී, සුරැකුම් මිලදී ගැනීම සඳහා විවිධ සේවා සපයන ආයතන අරමුදල් කළමනාකරණ හෙවත් ආයෝජන කළමනාකරණ ආයතන ලෙස හැඳින්වේ.

නිදසුන් :-

- Ceylon Asset Management
- Guardian Acuity Asset Management LTD
- Sri Lanka Business and Investment


**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
Copyright © e-thaksalawa.moe.gov.lk

**<u>ආයෝජන කළමනාකරණ ආයතන සපයන සේවා.</u>**

- නිකුතුව පිළිබඳ ආයෝජන ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම.
- ආයෝජන ඉල්ලුම්පත්‍ර භාර ගැනීම.
- ආයෝජකයින්ට සුරැකුම් බෙදාදීම.
- නිකුතුව පිළිබඳ මුදල් කළමනාකරණය.
- ප්‍රචාරක කටයුතු.

## ආන්තික සැපයුම්කරුවන් (Marginal Suppliers)

වෙළඳ ව්‍යාපාර ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළඳ ණය, අය කිරීම සහ ණය මිල දී ගැනීම (Factoring) සිදු කරනු ලබන ආයතන ආන්තික සැපයුම්කරුවන් ලෙස හැඳින්වේ. මේවා සාධ්‍යකරණ ආයතන ලෙස ද හැඳින්වේ.

## ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture Capital Companies)

නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ක්‍රියා කරන ආයතන ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් ලෙස හඳුන්වයි.

**<u>අරමුදල් සපයන කටයුතු;</u>**

- නව ව්‍යාපාර ආරම්භ කිරීම.
- පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම.
- ව්‍යාපාර පවරා ගැනීම.
- ව්‍යාපාර මිලදී ගැනීම.
- කොටස් ප්‍රාරක්ෂණය.

<u>නිදසුන් -</u>

- Merchant Bank of Sri Lanka & Finance PLC (MBSL)
- Kanrich Finance Limited
- Dunamis Capital PLC
- Central Investment & Finance PLC


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## රක්ෂණ සමාගම්

විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මඟින්, රක්ෂණ සමාගම්වල එකතු වන අරමුදල්, මූල්‍ය වෙළෙඳපොලේ ණයදීම හා ආයෝජනය කිරීම සිදු කරයි. ඒ අනුව, රක්ෂණ සමාගම් ද මූල්‍ය අතරමැදිකරණයේ යෙදෙයි.

<u>**නිදසුන්:-**</u>

- සී/ස ශ්‍රි ලංකා රක්ෂණ සංස්ථාව
- සී/ස සෙලින්කෝ රක්ෂණ සමාගම
- සී/ස ජනශක්ති රක්ෂණ සමාගම

Sri Lanka Insurance

CEYLINCO INSURANCE CO.LTD

JANASHAKTHI INSURANCE

අර්ථසාධක හා විශ්‍රාම අරමුදල්

- රාජ්‍ය කළමනාකාරීත්වයෙන් යුත් අරමුදල්
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
  - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
- පෞද්ගලික කළමනාකාරීත්වයෙන් යුත් අරමුදල්
  - අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල්



The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## සේවක අර්ථසාධක අරමුදල

- ශ්‍රි ලංකාවේ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා පවතින විශ්‍රාම අරමුදල මෙයයි.
- මෙම අරමුදල පරිපාලනය කරනු ලබන්නේ කම්කරු කොමසාරිස්වරයා විසිනි.
- අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම් සතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවටයි.

## සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

- මෙයද පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා පවතින අරමුදලකි.
- මෙම අරමුදල පරිපාලනය කරන්නේ, ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය යටතේ ඇති සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මඟිනි.

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

- රාජ්‍ය සේවකයන් සඳහා පවතින මෙම විශ්‍රාම අරමුදල, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් කළමනාකරණය කරනු ලබයි.

## පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල්

- අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල් කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education